(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 8(2).]

# පාර්ලිමේන්තුවේ අංක 8 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2018 ජනවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා**

---

## 2018 පෙබරවාරි මස 19 වැනි සඳුදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

භාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— මාධ්‍ය උපමාන,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 6 (2) වගන්තිය යටතේ ටෙලිනාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 නොවැම්බර් 07 දිනැති 2044/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු, 142 වගන්තිය යටතේ 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි (මිල ඉහළ සීමා) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 දෙසැම්බර් 14 දිනැති අංක 2049/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වගන්තිය යටතේ 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 04 දිනැති 2017/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 නොවැම්බර් 27 දිනැති අංක 2047/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2018 පෙබරවාරි මස 20 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2677/'17

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 අයවැයෙන් නාවික ක්ෂේත්‍රය, විදේශීය සමාගම්වලට 100%ක් විවෘත කිරීමට කළ යෝජනාවට එකඟ වන්නේද;

(ii) ලංකා නැව් ඒජන්තවරුන්ගේ සංගමය (CASA) විසින් රජයේ වගකිවයුතු නිලධාරින්ට ලිපියකින් දන්වා ඇති පරිදි, මෙම විවෘත කිරීම නැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) නැව් සමාගම් ඒකාධිකාරී වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මාර්තු මස 09 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

685/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ආහාරය සඳහා ගන්නා බිත්තර වර්ග මොනවාද;

(ii) එම බිත්තරවල වාර්ෂික අවශ්‍යතාවය වෙන් වෙන්ව දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව බිත්තර ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iii) 2016 වර්ෂය තුළ ආනයනය කළ බිත්තර ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බිත්තර ආනයනය සඳහා 2016 වර්ෂයේදී වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව බිත්තර අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iii) 2016 වර්ෂය තුළ අපනයනය කළ බිත්තර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 වර්ෂයේදී බිත්තර අපනයනයෙන් ශ්‍රී ලංකාව ලද ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1222/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1405/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 176ට අනුව, විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ව්‍යාපාර ඇරඹීම සඳහා සහනදායී පදනමින් ණය පහසුකම් ලබාදුන් පුද්ගලයන්ගේ හෝ ආයතනවල ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) වර්ෂ 1977 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍ය අපනයන මඟින් ඉපයූ විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් අපනයනකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) අයවැය යෝජනාවට අනුව, විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන්ට ණය පහසුකම් ලබා දීමේදී විශේෂයෙන් ලබාදුන් සහන කවරේද;

(v) 2017 වර්ෂය වෙනුවෙන් එකී සහන තවදුරටත් වලංගු වන්නේද;

(vi) විසිතුරු මසුන් අපනයන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වගකීම දරන රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව සෑහීමට පත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1575/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නම හා ලිපිනය කවරේද;

(ii) ඔහුට හිමි වැටුප් හා දීමනා කවරේද;

(iii) එම සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ නම හා ලිපිනය කවරේද;

(iv) ඔහුට හිමි වැටුප් හා දීමනා කවරේද;

(v) උක්ත තනතුරු දෙකම එක් පුද්ගලයකු විසින් දැරීමට හේතු කවරේද;

(vi) තනතුරු දෙකක් එක් පුද්ගලයකු විසින් දැරීම සුදුසු නොවන බව මුදල් අමාත්‍යාංශය විසින් දැනුම් දී තිබේද;

(vii) එසේ නම්, එම උපදෙස් පිළිනොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1738/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 සහ 2016 වර්ෂවලට අදාළව, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා 2016.10.18 දිනැති විගණන විමසුමක් නිකුත් වී තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම විගණන විමසුමේ පාසල් පාදක කළමනාකරණ හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳව තායිලන්තයේ හා පිලිපීනයේ පැවති ගුරු පුහුණු වැඩමුළුවලට අදාළව, අංක 2, ආ, ඇ, ඈ, ඉ සහ ඊ යන වගන්තිවල දැක්වෙන කරුණු සහ අංක 3 ඡේදයේ දැක්වෙන කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එහිදී සිදු වී ඇති යම් අක්‍රමිකතා, දූෂණ හා නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නිලධාරින්ට එරෙහිව පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1997/'17

ගරු බිමල් රත්නායක මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට 2015 සිට 2017 වර්ෂයේ ජූනි මස 30 දක්වා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 සිට 2017 ජූනි මස 30 දක්වා,

(i) විභාග කර අවසන් කර ඇති, විභාග කරමින් පවතින සහ විභාග කිරීම ආරම්භ නොකළ පැමිණිලි සංඛ්‍යාව;

(ii) අධිකරණයන්හි නඩු පවරා ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) නඩු පැවරීමට හෝ නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iv) මේ වනතෙක් නීතිපති උපදෙස් නොලැබුණු පැමිණිලි සංඛ්‍යාව;

(v) පවරා ඇති නඩුවලින් දේශපාලනඥයන් හා සම්බන්ධ නඩු සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, මතුගම අධ්‍යාපන කලාපයේ පිහිටි කලෙලමගල් දෙමළ විද්‍යාලයේ ශිෂ්‍යයන් හාරසියයකට අධික පිරිසක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබමින් සිටින බවත්;

(ii) මෙම පාසල "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා මාස දෙකකට පෙර මුල්ගල් තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii)හි සඳහන් සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඉහත පාසලෙහි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම පන්ති ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2175/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ, මීරියබැද්ද නායයෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2203/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙස්ට්හෝල් වත්තේ පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානය රජයට පවරාගෙන ග්‍රාමීය රෝහලක් බවට පත් කරන ලද බවත්;

(ii) මෙම ග්‍රාමීය රෝහල මඟින් එම ප්‍රදේශයේ පවුල් 3500 - 4000 ක් අතර ප්‍රමාණයකට සේවය සැලසූ බවත්;

(iii) දැනට වසරකට පෙර වෛද්‍යවරුන් හා උපකරණ හිඟය හේතුවෙන් මෙම රෝහල වසාදමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම රෝහල නැවත විවෘත කර වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් විසඳීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2204/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිවිධ හමුදාව සඳහා පුද්ගලයන් බඳවාගැනීමේදී, ආධුනික අපේක්ෂකයාගේ කල්ක්‍රියාව, චරිතය හා අධ්‍යාපන සුදුසුකම් ඉතා උසස් තත්ත්වයෙන් තිබුනද, පියාට අනවසර මත්පැන් චෝදනා තිබීම හෝ දඬ ගැසීම් සිදු කර තිබීම හේතුවෙන්, ආධුනික අපේක්ෂකයාගේ බඳවාගැනීම අහෝසිවී යන බව එතුමා දන්නෙහිද?

(ආ) මේ නීතිය ඉවත් කරලීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2215/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම මිශ්‍ර ජාතික පාසල කුඩා බුත්ගමුව රාජසිංහ විද්‍යාලය බවත්;

(ii) මේ වනවිට එම විද්‍යාලය භෞතික හා මානව සම්පත් හිඟ වීමෙන් දිනෙන් දින අභාවයට යමින් පවතින බවත්;

(iii) මෙම ජාතික පාසලේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 26ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 10ක් පවතින බවත්;

(iv) මේ හේතුවෙන් මෙම විද්‍යාලයේ සිසු සිසුවියන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසුව අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීමට වෙනත් පාසල් කරා යොමු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ඇති සැලසුම් කවරේද;

(ii) ඒ සඳහා පියවර ගනු ලබන දිනය කවරේද;

(iii) 2017 වර්ෂයේදී මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිපාදනවලින් දැනට සිදුකර ඇති වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

(v) 2018 වර්ෂයේදී මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබාදීමට සැලසුම්කර තිබේද;

(vi) එසේ නම්, එම ප්‍රතිපාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2221/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක WPGD 4998 දරන වාහනය හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයට අයත් බවත්;

(ii) 2000 වර්ෂයේදී මිලදීගෙන ලියාපදිංචි කර ඇති එම වාහනය මේ වනවිට කවර පුද්ගලයකුගේ භාරයේ පවතින්නේද යන්නත්;

(iii) උක්ත වාහනය කලකට පෙර වාවකච්චේරිය ප්‍රදේශයේ දේශපාලන බලවතෙකුගේ භාවිතයේ පැවති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, උක්ත වාහනය යළි ඔබ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2284/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට උපාධිධාරින් බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේ විභාගය පැවති දිනය කවරේද;

(ii) ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පැවති මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවති බව පිළිගන්නේද;

(iii) එම නිසා, විභාග අපේක්ෂකයන්ට ඉහත ඕනෑම භාෂාවකින් පිළිතුරු සැපයිය හැකි වූ බව පිළිගන්නේද;

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා සිංහල භාෂාවෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදී තිබේද;

(v) එසේ නම්, සිංහල මාධ්‍ය ප්‍රශ්න පත්‍රයටද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුයැයි අදාළ විභාගය සඳහා අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ හෝ වෙනත් ආකාරයකින් පූර්ව දැනුම්දීමක් කර තිබුණේද;

(vi) ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයීම නුසුදුසුකමක් වන්නේ යැයි පූර්ව දැනුම්දීමක් කර නොතිබියදී, සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2433/'17

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලිකරණය කිරීමේ ගිවිසුම මඟින් ලබාදෙන ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදෙන පදනම කවරේද;

(ii) මෙම ගිවිසුම මඟින් මෙහෙයුම් පර්යන්ත සඳහා ලබාදෙන ඉඩම් සඳහා බදු කුලියක් අය කරන්නේද;

(iii) මෙම වරායේ තෙවැනි සහ සිව්වැනි අදියර ඉදිකිරීමේ අයිතිය ගිවිසුම්ගත සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(v) හම්බන්තොට වරායේ දෙවැනි අදියරේදී, ඉදිකරන ලද අක්කර 110ක විශාල දූපත මෙම සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(vi) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(vii) මේ සඳහා දේශීය හෝ ජාත්‍යන්තර සමාගමක් මඟින් තක්සේරුවක් ලබාගෙන තිබේද;

(viii) නොඑසේ නම්, එම වටිනාකම නිර්ණය කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2018 මාර්තු මස 20 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

689/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උණ ලී ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය මඟින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උණ ලී නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එමඟින් 2015 වර්ෂය තුළ ලබාගත් ආදායම කොපමණද;

(iii) එකී නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ උණ ලී කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1224/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1420/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 187 යෝජනාවෙන් හඳුන්වාදීමට යෝජනා කරන ලද ඩිජිටල් හැඳුනුම්පතෙහි දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම හැඳුනුම්පත නිකුත් කිරීමේ බලධාරියා කවුරුන්ද;

(iii) පුරවැසියන්ට හැඳුනුම්පත් ලබාදීම වෙනුවෙන් ඇස්තමේන්තු පිරිවැය කොපමණද;

(iv) එම පිරිවැය දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(v) 2017 වර්ෂය තුළදී ඩිජිටල් හැඳුනුම්පත් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අයවැයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1898/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් සභාවේ මහජන නියෝජිතයන් හා මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ විදේශ අධ්‍යයන චාරිකා සම්බන්ධයෙන් අනාවරණය කර ඇති ඡේද අංක 3 (අ) (i) සිට (x) දක්වා කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළ වාර්තාවේ (ආ) (i) සිට (iii) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1998/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහා පරිමාණ වංචා දූෂණ පිළිබඳව සොයා බැලීමේ ජනාධිපති විමර්ශන කොමිසමට 2015 සිට 2017 වර්ෂයේ ජූනි මස 30 දින දක්වා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2015 සිට 2017 ජූනි මස 30 දක්වා,

(i) විභාග කර අවසන් කර ඇති, විභාග කරමින් පවතින සහ විභාග කිරීම ආරම්භ නොකළ පැමිණිලි සංඛ්‍යාව;

(ii) අධිකරණයන්හි නඩු පවරා ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) නඩු පැවරීමට හෝ නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iv) මේ වනතෙක් නීතිපති උපදෙස් නොලැබුණු පැමිණිලි සංඛ්‍යාව;

(v) පවරා ඇති නඩුවලින් දේශපාලනඥයන් හා සම්බන්ධ නඩු සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2070/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී ත්‍රිකුණාමලය, මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මනච්චේනයි ඉරුදයපුරම් ගම්මානයේ පවුල් 125කට අධික සංඛ්‍යාවක් නැවත පදිංචි කරන ලද බවත්;

(ii) එම ජනතාව එම ගම්මානවල නැවත පදිංචි කළ කාලයේ සිට මූලික පහසුකම් හා ස්ථිර නිවාස ලබා නොදීම හේතුවෙන් දැඩි පීඩාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානවලට මූලික පහසුකම් සහ ස්ථිර නිවාස පහසුකම් ලබාදීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2133/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2143/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය ජලජ වගාව සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීමේ සමීක්ෂණයක් ඔබ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළේද;

(ii) එසේ නම්, වයඹ පළාත තුළ මිරිදිය ධීවර කර්මාන්තයට සුදුසු ස්ථාන ලෙස හඳුනාගෙන ඇති ස්ථාන කවරේද;

(iii) එම ස්ථාන අතරින්, මිරිදිය ධීවර කර්මාන්තය දැනටමත් ආරම්භ කර ඇති ස්ථාන කවරේද;

(iv) සෙසු ස්ථානවල මිරිදිය ධීවර කර්මාන්තය ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2180/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.07.31 දිනට ආණ්ඩුවේ රැකියා දස ලක්ෂයේ ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2223/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ, නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දීර්ඝ කාලයක් මුළුල්ලේ පැරණි ගොඩනැගිල්ලක ක්‍රියාත්මකවීම හේතුවෙන්, සේවාවන් ලබා ගැනීමට පැමිණෙන ජනතාව මෙන්ම, එහි සේවය කරන නිලධාරීන්ද විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත්;

(ii) නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් ම'විසින් යොමු කරන ලද 2017.07.06 දිනැති ලිපිය පිළිබඳවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉදිරියේදී නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2232/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික බස්රථවලින් ගමන් ගන්නා මගීන් අතර ජනප්‍රිය හා ලාභදායී වූ පෙර ගෙවුම් කාඩ්පත් මගින් ගාස්තු ගෙවීමේ ක්‍රමයක් පසුගිය කාලයේදී ක්‍රියාත්මක වූ බවත්;

(ii) මාර්ග අංක 122, 138, 177 සහ 03 දරන පෞද්ගලික බස්රථ තුළ ක්‍රියාත්මක වූ මෙම ක්‍රමය මගීන් අතර සීඝ්‍රයෙන් ජනප්‍රිය වීමෙන් ගමන් ගාස්තුවෙන් 20%ක වට්ටමක්ද මගීන්ට ලැබුනු බවත්;

(iii) මෙම ක්‍රමය හේතුවෙන් කලට වේලාවට බස් ධාවනය වූ අතර මගීන්ට රාජකාරි කටයුතු සඳහා නියමිත වේලාවට වාර්තා කළ හැකි වූ බවත්;

(iv) බස්හිමියන්ටද තම ආදායම කඩිනමින් හා නිවැරදිව ලැබුනු අතර කොන්දොස්තර හා රියදුරුටද මෙමගින් කිසිදු අසාධාරණයක් සිදු නොවූ බවත්;

(v) නමුත් දැනට මාස කිහිපයක සිට ඉහත (ii) හි සඳහන් මාර්ග අංකවලට අයත් බස්රථයන්හි එම කාඩ්පත් භාර නොගන්නා අතර එම කාඩ් යන්ත්‍ර කැඩී ඇති බව ඇතැම් කොන්දොස්තරවරුන් පවසන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) වහාම ක්‍රියාත්මක වන පරිදි එම පෙර ගෙවුම් කාඩ්පත් ක්‍රමය ඉහත කී මාර්ගයන්හි හා අනෙකුත් මාර්ගවලද ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2290/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වූ දිනය කවරේද;

(ii) ධූරයට පත් වූ දිනයේ සිට අද දක්වා ඔහු නිරත වී ඇති විදේශ සංචාර කවරේද;

(iii) එම එක් එක් විදේශ සංචාරයේ අරමුණු කවරේද;

(iv) ඒ සඳහා වැය වූ මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම සංචාර තුළින් සබරගමුව පළාතේ ජනතාවට අත්වූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2315/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාද්දුව හන්දියේ සිට, මොරොන්තුඩුව හන්දිය දක්වා දිවෙන වාද්දුව මොරොන්තුඩුව මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සහ අවසන් කිරීමට යෝජිත දින කවරේද;

(ii) එම මාර්ගයේ දිග, දැනට තාර යොදා ඇති ප්‍රමාණයේ පළල හා මුළු පළල කොපමණද;

(iii) කාපට් ඇතිරීමට බලාපොරොත්තු වන පළල සහ සංවර්ධනයෙන් අනතුරුව, පාරේ මුළු පළල කොපමණද;

(iv) සංවර්ධනය කරනු ලබන පාලම් සංඛ්‍යාව සහ බෝක්කු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මාර්ග ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම මුදලින් ඉඩම් හා දේපළ වන්දි ලෙස වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) ඉදිකිරීම් කාර්යය සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) ඉදිකිරීම් කාර්ය සිදුකරන්නේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ, නම් ඒ මන්ද?

2322/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී, කෘෂිකර්ම අමාත්‍යාංශයේ, මාතලේ ගොවිජන සංවර්ධන කොමසාරිස් කාර්යාලය මඟින් ආරම්භ කළ ව්‍යාපෘතිය යටතේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රතිසංස්කරණය කළ එක් එක් වැවට වෙන් කළ ප්‍රතිපාදන මුදල සහ පෝෂිත කුඹුරු අක්කර ප්‍රමාණය කවරේද;

(ii) ප්‍රතිසංස්කරණය සඳහා කොන්ත්‍රාත්තුව ලබා ගත් එක් එක් ගොවි සංවිධානය, ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් කොන්ත්‍රාත්තුවෙන් එම ගොවි සංවිධානවලට ලැබුණු ලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ගොවි සංවිධානයේ ගිණුමට ලාභය බැර වී තිබේ නම්, එම තොරතුරු සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගොවි සංවිධාන විසින් ලබාගත් ව්‍යාපෘති කොන්ත්‍රාත්තු උප කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබේ නම්, එම උප කොන්ත්‍රාත් ගිවිසුම් සභාගත කරන්නේද;

(ii) ගිවිසුම්ගත නොවී වාචික එකඟතාවයෙන් උප කොන්ත්‍රාත් ලබාදීමට ගොවිජන සංවර්ධන නිලධාරින් එකඟත්වය ලබා දී තිබේද;

(iii) එක් එක් ව්‍යාපෘතියෙන් ගොවි සංවිධානවලට ලැබී ඇති ප්‍රතිලාභ, කොමිස් මුදල කොපමණද;

(iv) ගොවි සංවිධානවලට උප කොන්ත්‍රාත් ලබාදීමෙන් ලැබුණු ප්‍රතිලාභ, කොමිස් මුදල් හා එය කොන්ත්‍රාත්තුවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මාර්තු මස 21 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

690/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වේවැල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය මඟින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වේවැල් නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළ ලබාගත් ආදායම කොපමණද;

(iii) එකී නිෂ්පාදන අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ වේවැල් කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1227/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1421/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 189 යෝජනාවට අනුව, විශේෂ අරමුණු සඳහා වන සමාගමක් (Special Purpose Company) පිහිටවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම සමාගම කවරේද;

(iii) උක්ත සමාගමෙහි සාංගමික සංස්ථා පත්‍රයෙහි සඳහන් වන අරමුණු කවරේද;

(iv) එම සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියෙහි ප්‍රධාන නියමයන් කවරේද;

(v) උක්ත සමාගමෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1662/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පෙර පාසලේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා විසින් පෙර පාසල් සඳහා පාසල් බෑග් ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ මේ දක්වා එම ප්‍රතිලාභය ලබාගෙන ඇති පෙර පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව හා ඔවුන්ගේ නම් කවරේද;

(iv) මේ සඳහා වැය වූ මුදල් ප්‍රමාණය හා ඒ සඳහා මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2003/'17

ගරු බිමල් රත්නායක මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2071/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ, පූනහරි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දෙපාර්තමේන්තුවට අයත් ට්‍රැක්ටර් 23ක් හා අත් ට්‍රැක්ටර් 8ක් කිසිම නඩත්තුවක් හෝ ප්‍රයෝජනයක් නොගෙන අතහැර දමා තිබෙන බවත්;

(ii) මෙම ට්‍රැක්ටර් අනාරක්ෂිතව වර්ෂ 4ක කාලයක් පුරා එළිමහනේ තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ට්‍රැක්ටර් අලුත්වැඩියා කර භාවිතයට යොදාගැනීම සම්බන්ධයෙන් කිසියම් පියවරක් ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා අලුත්වැඩියා කරනු ලබන කාලය සහ අලුත්වැඩියාවෙන් පසු භාවිතයට ගනු ලබන ආකාරය කවරේද;

(iii) නොඑසේ නම්, එම ට්‍රැක්ටර් අලුත්වැඩියා කර සාධාරණ මිළ ගණන් යටතේ ගොවි සංවිධානවලට බදුදීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2134/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2144/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ සේවය කරන ගුරුවරු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ගුරුවරුන්ට ආපදා ණය ගෙවීම සඳහා නිදහස් කර ඇති මුදල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) 2015 සිට මේ දක්වා ආපදා ණය ඉල්ලුම් කළ ගුරුවරුන් සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මේ වනවිට ආපදා ණය ගෙවා ඇති ගුරුවරු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) දැනට ආපදා ණය ගෙවා නොමැති ගුරුවරුන්ට එම ණය ගෙවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2181/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.08.18 දින සිට 2017.07.31 දින දක්වා කාලය තුළ නාගරික සංවර්ධන අධිකාරියට බඳවා ගත් උපදේශකයන්ගේ, සම්බන්ධීකාරකවරයන්ගේ සහ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයන්ගේ,

(i) නම්;

(ii) අධ්‍යාපන සුදුසුකම්;

(iii) වෘත්තීය සුදුසුකම්;

(iv) වැටුප් සහ දීමනා;

(v) කාර්ය මණ්ඩල පහසුකම්;

(vi) වාහන ඇතුළු වෙනත් පහසුකම්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2226/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කිලිනොච්චි - මුලතිව් A-50 ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති ප්‍රධාන පාලම වන මීටර් 402ක් දිගැති වට්ටුවාකල් පාලම එක් වාහනයක් පමණක් ගමන් කළ හැකි තරම් පටු වීම සහ කිසිදු ප්‍රතිසංස්කරණයක් නොකිරීම හේතුවෙන් ගමනාගමනයට අවහිරයක් වී ඇති බවත්;

(ii) මෙම වට්ටුවාකල් පාලම ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව, මවිසින් 2017.07.31 දිනැති ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, වට්ටුවාකල් පාලම, නිශ්චිත කාලයක් තුළ වාහන දෙකක් ගමන් කළ හැකි වන පරිදි පුළුල් කර ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2291/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පුරා විද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, එම ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2316/’17

ගරු ජයන්ත සමරවීර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 මැයි 27 වැනි දින ඇතිවූ ගංවතුර හා නායයෑමේ ආපදාවෙන් කළුතර දිස්ත්‍රික්කයේ පූර්ණ, අර්ධ හා සුළු හානි සිදු වූ ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපාරික ස්ථාන සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපාර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියා වශයෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ව්‍යාපාර සත්ව පාලන, කාර්මික, වෙළඳ හා වෙනත් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ ගංවතුරෙන් හා නායයෑමෙන් විනාශ වූ ව්‍යාපාර අයිති පුද්ගලයාගේ නම, ලිපිනය, හානියේ තක්සේරුගත වටිනාකම, එම ව්‍යාපාරය පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(ii) කළුතර දිස්ත්‍රික්කයේ එසේ හානිවූ ව්‍යාපාර සඳහා මේ වනවිට රජයෙන් වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, වන්දි හිමිවූ ව්‍යාපාරිකයාගේ නම, ලිපිනය, ව්‍යාපාරය සහ ගෙවන ලද වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) කළුතර දිස්ත්‍රික්කයේ මේ වනවිට වන්දි ගෙවා ඇති ව්‍යාපාර සංඛ්‍යාව සහ මුළු වන්දි මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2323/’17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය විවෘත කළ දිනය කවරේද;

(ii) එම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකළ සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

(iv) ක්‍රීඩාංගණය විවෘත කළ දිනයේ සිට අද දක්වා එම ක්‍රීඩාංගණයේ පැවති ටෙස්ට් තරඟ, එක්දින තරඟ සහ 20 - 20 තරඟ සංඛ්‍යාව කොපමණද;

(v) එම තරඟවලින් ඉපැයූ ආදායම කොපමණද;

(vi) එහි සේවයේ නියුතු සේවක සංඛ්‍යාව හා එම සේවකයන් අතරින්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට සෘජුව අයත් සේවකයන් හා දිස්ත්‍රික්ක ක්‍රිකට් සංගමයට අයත් සේවකයන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම සියලු සේවකයන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අනුයුක්ත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2327/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැල්ලම්පිටිය, අවිස්සාවේල්ල පාරේ, අංක 137 දරන ලිපිනයේ පදිංචි කේ. ඩී. ප්‍රේමසිරි යන අයට මාර්ග සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීමේදී සිදු වූ අසාධාරණයක් වෙනුවෙන් ඔහු විසින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ අභියාචනය භාර නොගෙන ආපසු හරවා එවා ඇති බව දන්නේද;

(ii) සිදු වූ යම් අසාධාරණයක් පිළිබඳව යම් පුද්ගලයෙකු අභියාචනයක් ඉදිරිපත් කළවිට, එය භාරගැනීම සාමාන්‍ය සම්ප්‍රදායක් වුවද, එය ප්‍රතික්ෂේප කර ආපසු එවීම රාජ්‍ය සේවකයෙකු විසින් නොකළ යුත්තක් බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම අභියාචනය භාරගෙන ඒ සඳහා සාධාරණ ක්‍රියාමාර්ගයක් ගෙන ඒ පිළිබඳව අභියාචනාකරුට දැනුම් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මාර්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

691/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පන් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වන විට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළෙඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙය රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි කර්මාන්තයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පන් නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වසර තුළ ලබාගත් අපනයන ආදායම කොපමණද;

(iii) අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ පන් කර්මාන්තයට අවශ්‍ය වෙළෙඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1228/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1423/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උසස් ඩිජිටල්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2016 අයවැයෙහි අංක 193 යෝජනාවට අනුව වෙන්කළ රුපියල් මිලියන 10,000ක මූල්‍ය ප්‍රතිපාදනය 2016 වර්ෂය තුළදී උපයෝජනය කළ ආකාරය ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අයවැය යෝජනාවෙන් ප්‍රතිලාභ හිමිකරගත් තැනැත්තන් හෝ ආයතනවල නාමලේඛනයක් හා ලබාගත් මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) 2016 අයවැය වෙන්කිරීම වූ රුපියල් මිලියන 10,000 ක මුදලින් වැය කළ නොහැකිවූ මුදල් ප්‍රමාණය, 2017 වර්ෂයේදී උපයෝජනය කර ගනු ලබන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1663/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු, මේ දක්වා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට බඳවා ගෙන ඇති උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපදේශකයන්ගේ නම්, ලිපිනයන් හා අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එම උපදේශකයන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ වරප්‍රසාද කවරේද;

(iv) ඉහත (iii) හි සඳහන් කාරණය සඳහා මේ දක්වා වැය කර ඇති මුළු මුදල කොපමණද;

(v) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් සේවා ලබා ගන්නා පොදු ජනතාවට මෙම උපදේශකයන් මඟින් අත්වන ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/'17

ගරු බිමල් රත්නායක මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරින් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2072/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ ජනතාව නැවත පදිංචි කරන ලද ප්‍රදේශයන්හි පිහිටි නිවාස සඳහා පසුගිය කාලයේදී "උතුරු වසන්තය" වැඩසටහන යටතේ නොමිලේ විදුලිබල සම්බන්ධතාවන් ලබාදෙන ලද බවත්;

(ii) ඉන් පසුව මාසිකව විදුලි ගාස්තු අය කර ඇති බවත්;

(iii) ඒ අනුව, කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ජනතාව නැවත පදිංචි කරන ලද ප්‍රදේශයන්හිද විදුලි ගාස්තු මාසිකව අය කර ඇති බවත්;

(iv) එසේ වුවද, පසුගිය මාස 6ක කාලසීමාව තුළ කිළිනොච්චිය දිස්ත්‍රික්කයෙහි මෙම ගාස්තු අයකර නොමැති බවත්;

(v) මාසිකව විදුලි ගාස්තු අය නොකර එකවර මාස කිහිපයක් සඳහා ගාස්තු අය කිරීමෙන්, විශාල මුදලක් එකවර ගෙවීමට තරම් ආර්ථික ශක්තියක් නොමැති එම ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුලි ගාස්තු මාසිකව අයකර නොගැනීමට හේතුව කිළිනොච්චිය විදුලිබල මණ්ඩල කාර්යාලයෙහි සේවක පුරප්පාඩු පැවතීමද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගන්නේද;

(iii) හිඟ මුදල් වාරික පදනමින් අය කර ගැනීමට පියවර ගන්නේද;

(iv) ඉදිරියේදී, මාසික පදනමින් අඛණ්ඩව විදුලි ගාස්තු අය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2135/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2145/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි ලංගම ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) දැනට එක් එක් ඩිපෝව සතු ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව, එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංගම ඩිපෝවල බස්රථ ඇණිය වැඩිදියුණු කිරීම සඳහා අලුතින් ලබාදුන් බස් රථ සංඛ්‍යාව කොපමණද;

(v) ඉදිරියේදී පුත්තලම දිස්ත්‍රික්කයේ ලංගම ඩිපෝවල බස්රථ ඇණිය වැඩිදියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2182/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී රාජ්‍ය ණය ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී ඒක පුද්ගල රාජ්‍ය ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2292/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගියදා ඇති වූ අයහපත් කාලගුණික බලපෑම හේතුවෙන් පීඩාවට පත් වූ රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වසම්වල නම් කවරේද;

(iii) එම එක් එක් වසමේ පීඩාවට ලක් වූ පවුල් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුනට සහන සැලසීම සඳහා අමාත්‍යාංශය ගත් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2317/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.05.27 දින ඇතිවූ ගංවතුර හා නායයෑමෙන්, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොලේගොඩ සිට ඉහළ වෙල්ගම දක්වා දිවෙන මාර්ගයේ 1 කණුව නමැති ප්‍රදේශය නායයෑමෙන් මේ වනවිට එම මාර්ගය භාවිතා කළ නොහැකි තත්ත්වයට පත්වී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය හේතුවෙන් එකී මාර්ගය පරිහරණය කළ අංක 819G මුදුන, 819H ගමගේ වත්ත, 824 තැන්නහේන සහ 825 ඉහල වෙල්ගම යන ග්‍රාම සේවා කොට්ඨාසවල පිහිටි ඕමත්ත ජනපදය, ඕමත්ත කොළණිය, ගම්පලකන්ද, වවුලාකන්ද, මුදුන, බටේගල්ල, තැන්හේන, සමහිපුර, ඉහල වෙල්ගම, ගල්ලනමුල්ල, හේන්යාය සහ අටහවුල්හේන යන ප්‍රදේශවල 10,000 - 15,000 ක් අතර ජනතාවක් බරපතල පීඩාවකට පත්වී ඇති බවත්;

(iii) මෙම මාර්ගය යථාවත් කිරීමට දැනට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) භාවිතා කළ නොහැකි සේ විනාශ වී ඇති උක්ත මාර්ගය කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දින වකවානු හා අවසන් කරන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2324/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල, දිගම්පතන ප්‍රදේශයේ රක්ෂිත වනාන්තරයක් පිහිටා තිබෙන බවත්;

(ii) ප්‍රදේශයේ පළාත් පාලන ආයතන විසින් එම ස්ථානයට කුණු බැහැර කරන බවත්;

(iii) කුණු බැහැර කිරීම හේතුවෙන් ප්‍රදේශයේ වන අලින් මෙම ස්ථානයේ නිතර ගැවසෙන බවත්;

(iv) එහි ආහාර නොමැති අවස්ථාවල එම අලින් අවට ගම්මානවලට කඩා වදින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මිනිසුන්ගේ හා අලින්ගේ ආරක්ෂාව සඳහා මෙම ස්ථානයට කුණු බැහැර කිරීම නැවැත්වීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2328/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ල, කුණු කන්ද කඩාවැටීම හේතුවෙන් එම ස්ථානයෙන් ඉවත් කළ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල්වලට ගෙවූ වන්දි මුදල වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(iii) පවුල් ඉවත් කර ඇති භූමියේ වර්තමාන වටිනාකම කොපමණද;

(iv) එම ඉඩම් වර්තමානයේදී අයත් වන්නේ කා හටද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2339/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය කාලයේ ත්‍රිකුණාමලය - මඩකලපුව, A15 මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලද බවත්;

(ii) මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී උප්පාරු ප්‍රදේශයට යාබදව පිහිටි මුරින්ජාරු ප්‍රදේශයේ ඉදිකළ යුතුව තිබූ බෝක්කුව ඉදි නොකළ බවත්;

(iii) එම නිසා ගංවතුර බැස යාමට නොහැකිව කින්නියා ප්‍රදේශය ගංවතුරෙන් යටවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ස්ථානයේ බෝක්කුවක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, බෝක්කුව ඉදිකිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මාර්තු මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

692/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පිත්තල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළෙඳපොළ පිළිබඳ ගැටලු පවතින බවත්;

(iii) මෙය රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි කර්මාන්තයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පිත්තල නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂය තුළ ලබාගත් අපනයන ආදායම කොපමණද;

(iii) අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ පිත්තල කර්මාන්තයට අවශ්‍ය වෙළෙඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1229/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1425/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 200 යෝජනාවට අනුව අපනයන සැකසුම් කලාප නවීකරණය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) අප රටෙහි දැනට ක්‍රියාත්මක අපනයන සැකසුම් කලාපයන්හි ප්‍රගතිය කවරේද;

(iii) නව අපනයන සැකසුම් කලාප ඇරඹීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මැදිහත් වී සිටින්නේද;

(iv) වර්ෂ 2000 සිට 2016 දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි කාර්ය සාධනය කවරේද;

(v) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1665/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන පාසල් කවරේද;

(ii) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව, එම පාසල්වලට පළාත් සභා ප්‍රතිපාදන මත ලබාදුන් ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) ගොඩනැගිලි ලබාදුන් පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම ඉදිකිරීම් ලබාදුන් පුද්ගලයන්ගේ හා සමාගම්වල නම් හා ලිපිනයන් කවරේද;

(v) එම ඉදිකිරීම් වෙනුවෙන් පළාත් සභාව වැය කරනු ලැබූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2005/’17

ගරු බිමල් රත්නායක මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධිකරණ අමාත්‍යවරියගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරිය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2112/’17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ‘පාලම් දහසක් සංවර්ධනය කිරීමේ වැඩසටහන’ යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටි ඌට්රුප්පුලම්, වල්ලුවර්පන්නෙයි ගම්මානය කරා දිවෙන ප්‍රධාන මාර්ගයේ පිහිටා තිබෙන පාලමෙහි ඉදිකිරීම් කටයුතු, 2016 අගෝස්තු මස 25 දින ආරම්භ කරන ලද බවත්;

(ii) මෙහි කොන්ත්‍රාත් කාලය 2017 මැයි මස 21 දින අවසන් වූ බවත්;

(iii) එහෙත්, ඉහත පාලමෙහි ඉදිකිරීම් කටයුතු මේ දක්වා සම්පූර්ණ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාලමෙහි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2136/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් අනුරාධපුර සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනීම ලැබූ පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2152/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කිලෝමීටර් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සංඛ්‍යාව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ශ්‍රේණිගත කිරීම්වලට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2013, 2014, 2015, 2016 සහ 2017 යන වර්ෂයන්හි වයඹ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ කාපට් අතුරන ලද මාර්ග සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වයඹ පළාත් සභාවට අයත් මාර්ග සංවර්ධනය කිරීමට හා නඩත්තු කිරීමට ප්‍රතිපාදන සපයනු ලබන ප්‍රභවයන් කවරේද;

(v) 2013, 2014, 2015, 2016 සහ 2017 යන වර්ෂයන්හි ඉහත ප්‍රභවයන් යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, පළාත් මාර්ග සංවර්ධනය සඳහා වැය කරනු ලැබූ මුදල් ප්‍රමාණය එක් එක් ප්‍රභවය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2183/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.09.01 දින සිට 2017.07.31 දින දක්වා ජනාධිපතිවරයා, අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා සහ අමාත්‍යවරුන් සමඟ යෙදුනු විදේශ සංචාර ද ඇතුළුව එක් එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා යෙදුණු නිල විදේශ සංචාර සංඛ්‍යාව, අවරෝහණ පිළිවෙළට එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2293/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාත් සභාව යටතේ පාලනය වන රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) සබරගමුව පළාත් සභාවේ වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් අනතුරුව අළුතින් ආරම්භ කරනු ලැබූ පාසල් තිබේද;

(iv) එසේ නම්, එම පාසල්වල නම් හා දැනට සේවයේ නියුතු ගුරුවරුන් සහ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වත්මන් සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් පසුව දිස්ත්‍රික්කය තුළ වැසීගිය පාසල් තිබේද;

(vi) එසේ නම්, එම පාසල්වල නම් කවරේද;

(vii) එසේ වසා දමනු ලැබූ පාසල්වල සම්පත්වලින් ප්‍රයෝජන ගැනීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2325/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,—පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාවට අයත් මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වාරිමාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාරිමාර්ගවල නම් කවරේද;

(iii) එම එක් එක් වාරිමාර්ග ක්‍රමයෙන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් වාරිමාර්ග ක්‍රම මඟින් වගා කරන ඉඩම් අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් සභාව විසින් මාතලේ දිස්ත්‍රික්කයේ වාරිමාර්ග සංවර්ධන කටයුතු සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2340/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා පොහොර සමාගමේ වර්තමාන සභාපතිවරයාගේ නම කවරේද;

(ii) එම තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) වර්තමාන සභාපතිවරයා විසින්, එම තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව, වෙනත් වෘත්තීය සුදුසුකම් සපුරා තිබේද;

(iv) එසේ නම්, ඒ කවරේද;

(v) සීමාසහිත ලංකා පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(vi) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vii) සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය ලබන වැටුප් සහ දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2369/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍ය සරත් ෆොන්සේකා ෆීල්ඩ් මාර්ෂල්වරයෙකු ලෙස මේ වනවිටත් ශ්‍රී ලංකා යුද හමුදාවට අනුයුක්තව සිටින්නේද;

(ii) ඔහුට සම්බන්ධ විය හැකි හමුදා ක්‍රියාකාරිත්වයේ කටයුතු කවරේද;

(iii) ඔහුට හමුදා නිළ ඇඳුමින් සහභාගී විය හැකි කටයුතු කවරේද;

(iv) හමුදා කටයුතුවලදී ඔහුට ලැබෙන හෝ ලැබිය හැකි බලතල කවරේද;

(v) හමුදාවේ නිලධරයෙකු ලෙස ඔහුට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීධුරයක් ඉසිලිය හැකිද;

(vi) හමුදාවේ නිලධරයෙකු ලෙස සිටිමින් ඔහුට අමාත්‍යධුරයක් දැරිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2397/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) වයඹ පළාත තුළ තැලසීමියා රෝගීන්ට අවශ්‍ය ප්‍රතිකාර සිදු කරනු ලබන රෝහල් කවරේද;

(iv) එම රෝගයට අවශ්‍ය ප්‍රතිකාර පහසුකම් අනෙකුත් රෝහල් සඳහාද ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

(v) එම රෝගීන් සඳහා ශල්‍යාගාරයක් සහ ජාන බැංකුවක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ තිබේද;

(vi) මෙම රෝගීන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර හා වෛද්‍ය පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අප්‍රේල් මස 03 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

839/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇතැම් නගරාන්තර දුරගමන් සේවා සීඝ්‍රගාමී දුම්රියවල නිදන මැදිරි ජරාජීර්ණ වී ඇති බවත්;

(ii) ඇතැම් දුම්රියවල ආපනශාලා පහසුකම් නොමැති බවත්;

(iii) පවතින ආපනශාලා විධිමත් නොවන බවත්;

(iv) දුම්රිය ආපනශාලාවල ප්‍රමිතියෙන් බාල ආහාරපාන අධික මිල ගණන්වලට විකුණනු ලබන බවත්;

(v) ඉහත සඳහන් කරුණු හේතුකොට ගෙන දුම්රිය මගීන් අපහසුතාවයට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත දුම්රියවල පහසුකම් ඉහළ නැංවීමට ගනු ලබන පියවර කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුදල ඇස්තමේන්තුගත කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1230/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1419/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 195 යෝජනාවට අනුව, සෘජු විදේශ ආයෝජන දිරි ගැන්වීමේ අරමුණින් "සංවර්ධනය සඳහා වූ නියෝජිතායතනය" නම් වූ සංවිධානයක් පිහිටවනු ලැබුවේද;

(ii) එසේ නම්, එහි සංයුතිය හා වගකීම් ව්‍යුහය කවරේද;

(iii) 1977 සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ලැබුණු මුළු විදේශ ආයෝජන, ආයෝජකයන් ලබාගත් ණය ද ඇතුළත් සෘජු විදේශ ආයෝජන සහ ණය රහිතව ලැබුණු සෘජු විදේශ ආයෝජන එක් එක් වර්ෂය අනුව දැක්වෙන ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) 2009 යුධ ගැටුම් නිමවීමෙන් පසු ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන වර්ධනය වූ අයුරු දැක්වෙන දත්ත හා ප්‍රස්ථාර සටහනක් සහ ප්‍රමුඛතා අනුපිළිවෙළට අනුව සෘජු විදේශ ආයෝජන රටට ගලා ආ ප්‍රධාන රටවල් පහ කවරේද;

(v) 2015 සහ 2016 වර්ෂයන්හිදී සාපේක්ෂව සෘජු විදේශ අයෝජන පහත වැටීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1666/’17

ගරු වජිරිර වජිෙජ්සිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් සංඛ්‍යාව කොපමණද;
(ii) එම රෝහල්වල නම් හා ලිපිනයන් කවරේද;
(iii) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා ලබාදී ඇති රෝහල් සුළු සේවක රැකියා සංඛ්‍යාව කොපමණද;
(iv) එසේ රැකියා ලබාදුන් අයගේ නම්, ලිපිනයන් හා රැකියා ලබාදුන් රෝහල් කවරේද;
(v) එම රැකියා ලබාදීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2006/’17

ගරු බිමල් රත්නායක මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධශාසන අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;
(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;
(iii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය මේ දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;
(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;
(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/’17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ, කණ්ඩාමලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කල්ලාරු ගම්මානයේ සුනාමි ව්‍යසනය හේතුවෙන් පීඩාවට පත් ජනතාව සඳහා වූ නිවාස යෝජනා ක්‍රමය යටතේ ස්ථිර නිවාස 143ක් ද, නැවත පදිංචි කරන ලද ජනතාව වෙනුවෙන් විවිධ නිවාස යෝජනා ක්‍රම යටතේ ලද නිවාස 100ක් ද වශයෙන් නිවාස 243 ක් ඉදිකර ඇති බවත්;
(ii) උක්ත නිවාස 243න් මේ වනවිට නිවාස 186ක පමණක් ජනතාව පදිංචි වී ඇති අතර ඉතිරි නිවාස 57හි කිසිවකු පදිංචි වී නොමැති වීමෙන් ඒවා හිස්ව පවතින බවත්;
(iii) පානීය ජලය, නිසි ප්‍රවාහන සේවාවන් සැපයීම හා මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොවීමෙන් ඉහත ගම්මානයෙහි දැනට පදිංචි වී සිටින ජනතාව දැඩි අපහසුතාවයන්ට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) දැනට හිස්ව පවතින නිවාස, නිවාස නොමැති පවුල් සඳහා ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2137/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යයාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2184/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2017 වර්ෂයේදී මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටීමෙන්;

(i) මියගිය සංඛ්‍යාව;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව;

(iii) විපතට පත්වූවන්ට රජය විසින් ගෙවූ මුළු වන්දි මුදල;

(iv) මියගිය පුද්ගලයෙකුට ගෙවූ වන්දි මුදල;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවූ උපරිම සහ අවම වන්දි මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අවතැන් වූ සියලු දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(ii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2228/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් යහපාලන රජය බලයට පත්වූ දින සිට මේ දක්වා විදේශ රටවල අත්අඩංගුවේ පසුවන ශ්‍රී ලාංකික ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවරයන් දැනට අත්අඩංගුවේ පසුවන රටවල් කවරේද;

(iii) එම ධීවරයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) එම ධීවරයන් මුදා ගැනීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(v) විදේශ රටවල අත්අඩංගුවේ පසුවන ධීවරයන්ගේ පවුල්වල සුභසාධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2294/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ලංගම ඩිපෝ අතරින් දැනට ලාභ හෝ පාඩු ලබන ඩිපෝ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා රත්නපුර දිස්ත්‍රික්කයේ එක් එක් ඩිපෝවට අලුතින් ලබා දුන් බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ඩිපෝවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව හා එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2326/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලේවල ප්‍රදේශයේ ඉහළ ලිග්ගල නමින් ගමක් තිබෙන බවත්;

(ii) මෙම ගමේ බහුතර පවුල් සංඛ්‍යාවක් ගඩොල් කපා ජීවත්වන බවත්;

(iii) පවතින දැඩි නියඟය, අමුද්‍රව්‍ය මිල ඉහළ යෑම සහ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම හේතුවෙන් මේ වනවිට එම ගම්මානයේ ජනතාව එම කර්මාන්තය කරගෙන යාමේදී දැඩි දුෂ්කරතාවන්ට ලක්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගම්මානයේ ජීවත්වන ජනතාවගේ ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2342/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රට තුළ සමෘද්ධි සහනාධාරය ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සහනාධාරවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දැනට සමෘද්ධි සහනාධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩු කිරීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් නව සමෘද්ධි සහනාධාර ලබාදීම හා අත්හිටුවීම සම්බන්ධයෙන් අදාළ නාමලේඛන ප්‍රසිද්ධ කර ඇති බවත්;

(ii) සමෘද්ධි සහනාධාර අත්හිටුවීමට අදාළ නාමලේඛනයන්හි ඉතා දිළිඳු හා ආබාධිත පුද්ගලයන් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඔවුන් වෙනුවෙන් වෙනත් කවර හෝ සහනයක් සලසන්නේද; නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2370/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිලූමැන්ඩල් වරාය පිවිසුම දෙපස භූමිය ශ්‍රී ලංකා වරාය අධිකාරියට පවරාගෙන බහාලුම් පරීක්ෂා කිරීමට භාවිතා කරන්නේ නම්, දැනට බහාලුම් පරීක්ෂා කරන අංශ පිහිටා ඇති නුගේ පාර යන ස්ථානය වෙත ගමන් කිරීමේදී ඇතිවන පැය 6 - 10 අතර විශාල ප්‍රමාදය වළක්වා ගත හැකි බව පිළිගන්නේද;

(ii) සමහර ආනයනකරුවන් ඔවුන්ගේ ගබඩා හිස්වනතුරු ආනයනය කර ඇති භාණ්ඩ නිදහස් කර ගැනීම ප්‍රමාද කරමින් ප්‍රමාද ගාස්තු ගෙවීමට කටයුතු කිරීම ඔවුන්ට ලාභයක් බව දන්නේද;

(iii) එසේ නම්, ඉහත (i) සහ (ii) සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2399/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පවතින නියඟය හේතුවෙන් කෘෂිකාර්මික හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලයෙන් වන්දි ලබාදුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එලෙස වන්දි ලබාදුන් ගොවි මහතුන්ගේ නාම ලේඛනය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව ඉදිරිපත් කරන්නේද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ එක් එක් ගොවි මහතාට ලබාදුන් වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම වන්දි ලබා දීමේදී සලකා බලන ලද නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අප්‍රේල් මස 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

892/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුලා වෙල්ලිය ග්‍රාමය ආශ්‍රිතව දිවි ගෙවන "වන්නි සිංහල" නම්, ජන වර්ගය පිළිබඳව සමීක්ෂණයක් කර තිබේද;

(ii) උක්ත ග්‍රාමයට අමතරව මෙම ජන වර්ගය ජීවත්වන වෙනත් ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) යුද සමයේදී විවිධ පීඩාවන්ට ලක්වූ මෙම ජනතාව දිවිගෙවන ගම්මානයන්හි මූලික අවශ්‍යතා අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iv) එම පහසුකම් කඩිනමින් ලබා දීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) මෙම ජනතාවගේ සාම්ප්‍රදායික උරුමයන් ආරක්‍ෂා කිරීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1231/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1424/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 201 මඟින් පුත්තලම, හම්බන්තොට සහ කිලිනොච්චිය වැනි විශේෂයෙන් හඳුනාගත් ප්‍රදේශවල විශාල වශයෙන් පරිසර සංවේදී කර්මාන්ත පිහිටුවන බවට කර ඇති යෝජනාවට අනුව 2016 වර්ෂයේදී එම ප්‍රදේශවල අලුතින් පිහිටවනු ලැබූ කර්මාන්ත කවරේද;

(ii) පරිසර සංවේදී කර්මාන්ත හඳුනාගැනීම සඳහා භාවිතා කරන දර්ශකයන් කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාප තුළ සහ ඉන් පිටත ස්ථානගත කර ඇති පරිසර සංවේදී කර්මාන්ත කවරේද;

(iv) උක්ත කර්මාන්ත මඟින් පරිසරයට ඇතිවන අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා රජය විසින් නිර්දේශිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1739/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹදිව වන්දනා ගමන් සංවිධානය කිරීමට අවසර ලත් ආයතන හා පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් හා පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා දඹදිව වන්දනා ගමන්වලදී මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම මියගිය පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) එම පුද්ගලයන් දඹදිව රැගෙන ගිය ආයතන කවරේද;

(vi) එසේ මියගිය පුද්ගලයන්ගේ පවුල්වල සුබසාධනය වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2007/'17

ගරු බිමල් රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම සංස්කෘතික අරමුදල සහ විෂයභාර අමාත්‍යවරයා අතර සම්බන්ධීකරණය සඳහා ආයතනයේ දැනට පවතින තනතුරුවලට අමතරව වෙනත් නිලධාරීන් පත්කර තිබේද;

(ii) එසේ නම්, පත්කර ඇති නිලධාරීන් සංඛ්‍යාව සහ තනතුරු කවරේද;

(iii) එම පත්වීම් ලබාදීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම පත්වීම් සඳහා සළකා බලන ලද අවම අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(v) ඔවුන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩිසුට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ග්‍රාමසේවා වසම් 27කට අයත් ගම්මාන 114ක කුඩා කෘෂිකාර්මික වැව් 45ක් පමණ තිබෙන බවත්;

(ii) ඉහත වැව් අවුරුදු ගණනාවක සිට ප්‍රතිසංස්කරණය කර නොමැති බැවින් යල කන්නයේදී වී ගොවීන් හා අනිකුත් ගොවීන්ට අදාළ කාලය තුළ වගා කටයුතුවල යෙදීමට නොහැකි වීමෙන් ඔවුන් බොහෝ පීඩාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැව්වලට ප්‍රමුඛත්වය ලබා දී, ඒවා ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය සතුව කිසියම් වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2138/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වවුනියාව දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1049/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ මහනගර සභා බලප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි කවරේද;

(iii) එම ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු මුදල හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැගිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ගොඩනැගිලිවල රථගාල් සඳහා ගෙවීමක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි අමාත්‍යාංශ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ගෙන යන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකරන්නේද;

(iii) කොළඹ මහනගර සභා සීමාවෙන් ශ්‍රී ජයවර්ධනපුර වෙත ගෙන යන හා ගෙන නොයන අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1233/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1426/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 202ට අනුව ඇමරිකානු ඩොලර් මිලියන 10 ක් ආයෝජනය කරන හෝ නව රැකියා අවස්ථා 500 ක් ජනිත කරන පසුගාමී ප්‍රදේශවල ආරම්භ කරනු ලබන ව්‍යවසායන් සඳහා සුවිශාල බදු සානුබලයන් නිර්දේශ කරනු ලැබූ පරිදි, 2016 වර්ෂය තුළදී ආරම්භ කරන ලද ව්‍යවසායන් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත යෝජනාව ඉදිරිපත් කිරීමේදී හඳුනාගත් පසුගාමී ප්‍රදේශ කවරේද;

(iii) එකී පසුගාමී ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2000 වර්ෂයේ සිට මේ දක්වා රජය මඟින් අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(iv) යටිතල පහසුකම් විශාල වශයෙන් සංවර්ධනය නොකර, පසුගාමී ප්‍රදේශවලට කර්මාන්ත ව්‍යාප්ත කළ නොහැකි බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1740/’17

ගරු චමින්ද විජේසිරි මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා අලි - මිනිස් ගැටුම හේතුවෙන් මියගිය අලි ඇතුන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ මියගිය අලි ඇතුන් මියගිය ස්ථාන කවරේද;

(iii) එම කාල සීමාව තුළ බරපතල තුවාල ලැබූ හා අසාධ්‍ය තත්ත්වයට පත් වූ අලි ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(iv) වත්මන් යහපාලන රජය යටතේ අලි ඇතුන්ගේ මරණ සංඛ්‍යාව හා අලි මිනිස් ගැටුම අවම කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2043/’17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්යය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) රාජ්‍ය අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2117/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද්ධය හේතුවෙන් 1985 වර්ෂයේදී අවතැන් වූ වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙඩිවෛත්තකල් ගම්මානයේ ජනතාවට, එම ගම්මානයේ නැවත පදිංචි වීමට අවසර ලැබී ඇතත්, ඒ සඳහා කිසිදු මූලික පහසුකම් සලසා නොමැති වීම හේතුවෙන් තවදුරටත් විවිධ ප්‍රදේශවල, විවිධ පීඩාවන් මධ්‍යයේ ජීවත්වන බවත්;

(ii) ඉහත ගම්මානයේ නිවාස, ප්‍රවාහනය ඇතුළු මූලික පහසුකම් නොමැති වීමත්, වන අලින්ගේ තර්ජන පැවතීමත් හේතුවෙන් ජනතාවට එහි නැවත පදිංචි වීමට නොහැකි තත්ත්වයක් ඇති වී තිබෙන බවත්;

(iii) ඉන්දියානු රජයේ මූල්‍ය ආධාර ඇතිව ප්‍රතිසංස්කරණය කරන ලද පාසල ද පාලුවට ගොස් ඇති බවත්;

(iv) ඉහත ගම්මානයට යාබදව පිහිටි කෝවිල් පුලයන්කුලම් ගම්මානයේද මූලික පහසුකම් නොමැතිවීම හේතුවෙන් මේ වනවිට පවුල් 09ක් පමණක් ජීවත් වන බවත්, එහි පාසල ද ගබඩාවක් වශයෙන් භාවිතා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවල මූලික පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ජනතාව නැවත පදිංචි කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2139/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් මාතලේ, නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යයාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2229/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පවතින අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු, වෙනත් ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනවල නම් හා ලිපිනයන් කවරේද;

(iii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව, වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ පාලනය වන ආයතන සඳහා බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) බඳවා ගනු ලැබූ සේවකයන්ගේ නම් හා බඳවාගත් තනතුරු වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(v) එසේ සේවකයන් බඳවා ගැනීමට පළාත් සභාව අනුගමනය කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2343/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ අධිවේගී මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කොපමණද;

(ii) මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම මාර්ගය ඉදිකිරීමේදී ඉඩම් හා අනෙකුත් දේපළ අහිමිවූවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් වෙනුවෙන් ලබාදීමට නියමිත වන්දි මුදල් මේ වනවිටත් ලබාදී තිබේද;

(v) එසේ නම්, ගෙවා ඇති මුළු වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015, 2016 සහ 2017 දක්වා, දක්ෂිණ අධිවේගී මාර්ගයෙන් රජය උපයාගත් මුළු ආදායම වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී මාර්ගයේ අලුත්වැඩියා සඳහා වෙන් කළ මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2344/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ විශ්වවිද්‍යාලය හා කැළණිය විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන ජාත්‍යන්තර සබඳතා විෂය පිළිබඳ ප්‍රථම උපාධිය හා පශ්චාත් උපාධි පාඨමාලාව සාර්ථකව හදාරා නිමකළ ශිෂ්‍යයන් එම විෂයය පිළිබඳව වසර තුන හතරක පමණ කාලයක් තුළ පුළුල් හැදෑරීමක් කර ඇති බැවින්, ඔවුන්ගේ දැනුම හා හැකියාව විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබා ගැනීමට දැනට යම් ක්‍රමවේදයක් තිබේද;

(ii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු එම පාඨමාලාවන් සාර්ථකව නිම කළ ශිෂ්‍යයන් ඔබ අමාත්‍යාංශයට බඳවාගෙන ඇත්නම්, ඔවුන් පිළිබඳ තොරතුරු ලබා දෙන්නේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී එම උපාධිධාරීන් ඔබ අමාත්‍යාංශයට බඳවා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2402/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට අද දක්වා වගාවේදී කෘෂි රසායනික ද්‍රව්‍ය නොසැලකිලිමත් කමින් භාවිතා කිරීම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මියගිය පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මියගිය පුද්ගලයන් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2434/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, වාද්දුව හන්දියේ සිට, මොරොන්තුඩුව හන්දිය දක්වා දිවෙන වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය සංවර්ධනය කිරීමේදී ඉඩම් හා දේපළ අහිමිවන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම, ලිපිනය, අහිමි වන ඉඩම් ප්‍රමාණය හා දේපළවල ස්වභාවය කවරේද;

(iii) ඉඩම් අහිමිවන පවුල් සඳහා වන්දි ගෙවීමට එකී දේපළ හා ඉඩම් මේ වනවිට තක්සේරුකර තිබේද;

(iv) එසේ නම්, වන්දි ගෙවීමට යෝජිත පවුල් සංඛ්‍යාව, පවුල්වල නම, ලිපිනය සහ ගෙවීමට නියමිත වන්දි මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ, නම් ඒ මන්ද?

2436/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දිනවල ඇතිවූ ගංවතුරින් විපතට පත් ප්‍රදේශයන්හි පදිංචි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා 04 වරක් පෙනී සිටිය හැකි බවට අග්‍රාමාත්‍යතුමා විසින් ප්‍රකාශයක් කළ බව දන්නේද;

(ii) එසේ වුවත්, මේ දක්වා එයට අදාළ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2461/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටා ඇති බස් නැවතුම්පොළ 1977 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රමානුකූලව අලුත්වැඩියා කර නොමැති බැවින්, ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) මේ හේතුවෙන් මගීන් මහත් හිරිහැරයට ලක් වන අතර බස් නැවතුම්පොළෙහි බස් හැසිරවීමද ඉතාමත් අසීරු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බස් නැවතුම්පොළ ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම් එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 අප්‍රේල් මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1232/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1429/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක158 ට අනුව, තේ මිශ්‍ර කිරීම සඳහා ආනයන සීමා ලිහිල් කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී මිශ්‍ර කිරීම සඳහා ශ්‍රී ලංකාවට ආනයන කළ තේ ප්‍රමාණය, මිල සහ ආනයනකරුවන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1977 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවට තේ ආනයන කරන ලද ප්‍රධාන තේ ආනයනකරුවන් දස දෙනාගේ නම් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1440/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානය නිර්මාණය කිරීමට වැයවූ මුදල කොපමණද;

(ii) ඒ සඳහා මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) 2015.01.01 සිට 2016.12.31 දින දක්වා ටෙලි සිනමා ගම්මානය ලබා ඇති ආදායම කොපමණද;

(iv) මෙහි පාලන කටයුතු සිදු කරන්නේ කවර ආයතනයක් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මානයේ සංවර්ධන කටයුතු සඳහා තවදුරටත් මුදල් යෙදවීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1741/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2010 වර්ෂයේ සිට අද දක්වා සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් අනතුරුව එම අධිකාරියේ මේ දක්වා ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ රැකියා ලබාදුන් අයගේ නම්, ලිපිනයන් හා තනතුරු නාම කවරේද;

(iv) එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(v) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවකයන්ගේ සුභසාධනය සඳහා ඌව පළාත් සභාව ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2140/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2205/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ තුන්දහස් හාරසීයකට අධික පවුල් සංඛ්‍යාවක් ධීවර කර්මාන්තයේ යෙදී සිටින බවත්;

(ii) මෙම ධීවරයන් කිලෝමීටර් 73ක් පමණ දිග වෙරළ තීරය සහ ගැඹුරු මුහුද භාවිතා කරමින් මෙම කර්මාන්තයේ යෙදී සිටින බවත්;

(iii) මෙම ප්‍රදේශයේ ප්‍රදීපාගාරයක් නොමැතිවීම හේතුවෙන්, ධීවර යාත්‍රා වැරදි දිශාවලට ගමන් කිරීම ඇතුළුව නොයෙකුත් ගැටලුවලට ධීවර ජනතාවට මුහුණ දීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රදේශයේ ප්‍රදීපාගාරයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2230/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත තුළ වකුගඩු රෝගය ඉතා වේගයෙන් පැතිර යන බව දන්නේද;

(ii) එසේ නම්, දැනට වකුගඩු රෝගීන් හමුවී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා එම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වාර්තා වී ඇති රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) වයඹ පළාතේ වකුගඩු රෝගීන්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රජය විසින් සලසා ඇති සෞඛ්‍ය පහසුකම් කවරේද;

(v) වකුගඩු රෝගීන් සිටින පවුල්වල සුභසාධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2234/'17

ගරු බිමල් රත්නායක මහතා,—ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2295/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සබරගමුව පළාත් සභාවට අයත් මාර්ග කිලෝමීටර් ප්‍රමාණය කොපමණද;

(ii) එම මාර්ග අතරින් වර්ෂ 2010 සිට මේ දක්වා පළාත් සභාව මඟින් ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් මාර්ගය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පළාත් සභාවට අයත් මාර්ග බොහෝ ප්‍රමාණයක් මේ වනවිට ඉතා අබලන් වී ඇති බැවින්, එම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2345/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට මාතලේ දිස්ත්‍රික්කයේ ස්ථිර සමෘද්ධි නිලධාරින් සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරි කොට්ඨාසවල නම් කවරේද;

(ii) සමෘද්ධි නිලධාරි පුරප්පාඩු පවතින ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iii) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2412/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, අනුරාධපුර ප්‍රධාන මාර්ගයට මුහුණ ලා "රිදීබැඳි ඇල්ල" නමින් ඉඩමක් තිබෙන බවත්;

(ii) එම ඉඩමේ "ගජමුතු පියස" නමින් නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මේ වනවිට මුදල් එකතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි නිවාස යෝජනා ක්‍රමයක් එම ස්ථානයේ ඉදිකිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමතිය ලබා ගෙන තිබේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(ii) මෙම ඉඩමෙහි නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මුදල් එකතු කිරීම ද කර ඇති බැවින් කිසියම් නීතිවිරෝධී කටයුත්තක් සිදුවී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2437/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ,

(i) රබර් වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක කවරේද;

(ii) රබර් වගා කර ඇති මුළු හෙක්ටයාර් ප්‍රමාණය කොපමණද;

(iii) වාර්ෂික රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් කොපමණද;

(iv) වැවිලි සමාගම් හා කුඩා වගාකරුවන් විසින් වාර්ෂිකව නිෂ්පාදනය කරන රබර් කිලෝග්‍රෑම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2462/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොල්ලංකුට්ටිගම ග්‍රාම නිලධාරි වසමේ, මාමිණියාව වැව "වාරි පුබුදු" ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද බවත්;

(ii) එහිදී කුඹුරු අක්කර 60 ක පමණ ප්‍රමාණයක් ජලයට යටවීමෙන් එම ගොවීන් අන්ත අසරණ තත්ත්වයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුව නිරාකරණය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2473/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රේගු අපනයන භාණ්ඩ පැය 24 කින් ද, ආනයන භාණ්ඩ පැය 48 කින් ද, නිෂ්කාශනය කරන බව ප්‍රචාරය කළ වෙළඳ දැන්වීම් සඳහා රේගු කළමනාකරණ අරමුදලින් රුපියල් මිලියන 40 ක් වියදම් කර ඇති බව පිළිගන්නේද;

(ii) රේගු අපනයන හා ආනයන අංශ වෙත භාරදෙන ලියවිලි නිවැරදිව සම්පූර්ණ කර භාරදෙන්නේ නම්, එම භාණ්ඩ පැය 06කට අඩු කාලයක් තුළ නිදහස් කළ හැකි බව සත්‍යයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2018 අප්‍රේල් මස 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1331/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමට (LTL Holdings (Pvt.) Ltd) අයත් උප සමාගම් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම උප සමාගම් පිහිටුවීමේ ක්‍රමවේදය කවරේද;

(iii) එම එක් එක් සමාගමෙන් කෙරෙන කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත සමාගම්වල ආදායමෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ලැබෙන ලාභ කොටසේ ප්‍රතිශතය, එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම ලාභ කොටස් නිවැරදි නොවන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එය නිවැරදි කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1407/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2016 අයවැයෙහි අංක 183 යෝජනාවට අනුව, අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි, පිහිටුවීමට යෝජනා කරන ලද විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපවලින්, 2016 වර්ෂය තුළ පිහිටවනු ලැබූ කලාප සංඛ්‍යාව සහ ඒවා පිහිටවූ ස්ථාන කවරේද;

(ii) උක්ත යෝජනාවට අනුව පිහිටවූ එක් එක් කලාපයක් වෙනුවෙන් රජය විසින් දරනු ලැබූ මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපයන්හි වගකීම දරන්නේ කවර රාජ්‍ය ආයතනයක් විසින්ද;

(iv) 2016 වර්ෂය තුළ එවැනි කලාප පිහිටවනු ලැබුවේ නම්, එම එක් එක් කලාපයක අපනයන ඉපයුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1542/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බණ්ඩාරවෙල ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල නිරත වන බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය මරු පහරක් වී ඇති බව පිළිගන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය හේතුවෙන් වගා හානි වූ ජනතාවට වන්දි ගෙවීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1618/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සබරගමුව පළාතේ පාසල් තුළ ගුරු හිඟයක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම ගුරු හිඟය පියවීම සඳහා ගනු ලබන ඉක්මන් ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

(iv) පළාත් සභා පාසල් සඳහා ගුරුවරුන් මාරු කිරීමේ ක්‍රමවේදය සබරගමුව පළාත තුළ නිසි පරිදි සිදු නොවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1702/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2016 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ බව සඳහන් කරමින් පුරප්පාඩු 980ක් සඳහා බඳවාගෙන ඇති බවත්;

(ii) නමුත්, මේ වනතෙක් විභාගයට පෙනී සිටි සෙසු අපේක්ෂකයන්ට ප්‍රතිඵල ලේඛනය පවා යවා නොමැති බවත්; අන්තර්ජාලයෙන්ද ලබාගැනීමට ඉඩක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ පිළිබඳව සොයා බලා ඉතිරි ප්‍රතිඵල නිකුත් කිරීමට පියවර ගෙන, ඒ අනුව සුදුසුකම් ලබන්නන් පුරප්පාඩු අනුව බඳවා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1704/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් ආයතනයේ,

(i) ලිපිනය;

(ii) උපාධි ප්‍රදානය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලබාගෙන ඇති දිනය;

(iii) පිරිනමනු ලබන උපාධි;

(iv) ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව;

(v) එක් එක් උපාධි පාඨමාලාව සඳහා අයකරනු ලබන මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1713/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004.12.26 දින ඇති වූ සුනාමි විපතට මුහුණ දුන් හම්බන්තොට නගර සභා නිවාස පාරේ අංක 3/19 දරන නිවසේ පදිංචිව සිටි ටී. එන්. අමීර් මහතා ඇතුළු 68 දෙනෙකුගේ ඉඩම් 2010.03.17 දින වෙරළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා පවරාගත් බවත්;

(ii) පවරා ගත් ඉඩම් සඳහා ඉහත සඳහන් පිරිසට මෙතෙක් වන්දි ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1751/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින පුරා මේ වනවිට පවත්වාගෙන යනු ලබන සිනමාශාලා කවරේද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම සිනමාශාලාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි සිනමාශාලා වර්ගීකරණයක් කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයටද;

(iii) එම සිනමාශාලා නියාමනය කරනු ලබන්නේ කවුරුන්ද;

(iv) ඉතා අඩු පහසුකම් සහිතව හා දුර්වල ක්‍රියාකාරිත්වයෙන් යුතුව පවත්වාගෙන යනු ලබන සිනමාශාලා තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, සිනමාශාලා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා, සිනමාශාලා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1776/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.03.31 දිනට විදේශයන්හි සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකික පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, ඔවුන් සේවයේ යෙදී සිටින රට අනුව, රැකියා වර්ගීකරණය අනුව සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව;

(ii) එම පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් ජාතීන්ට අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1780/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන, පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි රෝහල්, මධ්‍යම බෙහෙත්ශාලා සහ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ස්ථානවල නම් කවරේද;

(iii) ඉහත එක් එක් සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවක පුරප්පාඩු පවතීද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) එම සෞඛ්‍ය මධ්‍යස්ථාන දියුණු කිරීමට සහ සේවක පුරප්පාඩු පිරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1798/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් වාර්ෂිකව සිදුවන අපරාධ ගණයට අයත් වන සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අපරාධ නඩුවලදී අධිකරණ ක්‍රියාමාර්ගවලින් වරදකරුවන් වන පුද්ගලයන්ගේ ප්‍රතිශතය කොපමණද;

(iii) එම අගය ආසියාවේ අනිකුත් රටවල් සමඟ සසඳන විට ඉහළ අගයක් ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1865/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මීතොටමුල්ලට අමතරව, පළාත් පාලන ආයතන මඟින් කසළ බැහැර කර මේ වනවිට නිර්මාණය වී ඇති කසළ කඳු කවරේද;

(ii) ඒවා අයත්වන පළාත් පාලන ආයතන කවරේද;

(iii) වර්තමානයේ මෙම කසළ කඳුවල ඇති කසළ ප්‍රමාණය කොපමණද;

(iv) මේවා අතර දැනට අවදානම් තත්ත්වයේ පවතින කසළ කඳු තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි කසළ කඳුවලට තවදුරටත් කසළ බැහැර කරමින් ඒවා වර්ධනය වීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කිසියම් වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේද;

(iii) මේ සඳහා දේශීය හා විදේශීය වශයෙන් ආයෝජන ලබා ගැනීමේ වැඩසටහනක් තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) මේ වනවිට යම් වැඩසටහනක් ආරම්භ කර තිබේ නම්, එහි ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1949/'17

ගරු මයන්ත දිසානායක මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උඩරට ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පසුගිය රජය විසින් අහෝසි කිරීම හේතුවෙන් උඩරට ප්‍රදේශයේ ජනතාවට අසාධාරණයක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උඩරට සංවර්ධන අධිකාරියෙන් උඩරට ප්‍රදේශයට හිමි වූ සංවර්ධන ප්‍රතිලාභ කවරේද;

(ii) එම අධිකාරියට වෙන් කළ මුදල කොපමණද;

(iii) එම අධිකාරියෙන් සිදු කළ කාර්යයන් සහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති කවරේද;

(iv) උඩරට සංවර්ධන අධිකාරියේ සභාපතිත්වය සහ ආයතනික වගකීම් දරන ලද පුද්ගලයන් කවුරුන්ද;

(v) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් උඩරට ප්‍රදේශයේ දිළිඳු ගම්මානවල ජනතාවට ලබාදුන් රැකියා සහ රැකියා සංඛ්‍යාව කවරේද;

(vi) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් දිළිඳු ගම්මානවල ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව හා ව්‍යාපෘතිවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව නැවත ආරම්භ කිරීමට අදහස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2457/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇළිකිඹුලාවල, තිඹිරිඅත්තාවල සහ මාවතවැව යන ගම්මානවලට ප්‍රවේශ වන ග්‍රාමීය මාර්ග ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) එම මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස එම ගම්වාසීන් නිරන්තරයෙන් ඉල්ලීම් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(ii) මෙම මාර්ග ප්‍රතිසංස්කරණය කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 215/'18

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා,— ශ්‍රීලන්කන් සහ මිහින් ලංකා යන ගුවන් සමාගම්වලට අති විශාල අලාභ ලැබීමට හේතුපාදක වූ, රජය අනුමත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් හිතාමතාම උල්ලංඝනය කිරීමට අදාළ ගැටලු පිළිබඳව සහ එම අපක්‍රියාවන්ට වගකිව යුතු පුද්ගලයන් පිළිබඳව සොයා බලා වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

අමාත්‍ය මණ්ඩලය විසින් 2011 ජූලි මස 27 වැනි දින අනුමත කරන ලද තීරණය සහ අනෙකුත් කරුණු ඇතුළුව —

(අ) 2012 වසරේ සිට ආරම්භ වන පස් වසරක කාල සීමාවක් සඳහා ශ්‍රීලන්කන් සහ මිහින් ලංකා යන ගුවන් සේවා සමාගම්වලට හිමිකම් ප්‍රාග්ධනය වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 520.0ක් ආයෝජනය කිරීම;

(ආ) ඉහත කී අරමුදල් 2012 වසරේ සිට ඉදිරියට වාර්ෂික ජාතික අයවැය ඇස්තමේන්තුවලින් වෙන්කිරීම; සහ

(ඇ) දේශීය/ විදේශීය බැංකු හෝ මූල්‍ය ආයතනවලින් කෙටිකාලීන හදිසි ණය පහසුකම් ලබාගැනීම පිණිස ඇමරිකානු ඩොලර් මිලියන 270ක ස්වෛරී ඇපකර නොපමාව නිකුත් කිරීමට භාණ්ඩාගාරයට බලය ලබාදීම

යනාදී කරුණු සඳහා ද අනුමතිය ලබාදුන් හෙයින් ද;

ඉහත සඳහන් අනුමතිය ලබාදීමෙන් අනතුරුව, ඔවුන් විසින් සකසන ලද ව්‍යාපාර සැලසුම ප්‍රකාරව තම ගුවන්යානා සංචිතය අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා මුල පිරීමට ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් 2012 වසරේදී කටයුතු කරන ලද හෙයින් ද;

එයාර් බස්, බෝයිං, රෝල්ස් රොයිස් සහ ජෙනරල් ඉලෙක්ට්‍රික් යන සමාගම් සමඟින් සාකච්ඡා සම්මුති පැවැත්වූ ශ්‍රීලන්කන් ගුවන් සමාගම එකී නිෂ්පාදකයන් සමඟින් පැවති සාකච්ඡා, සම්මුති නිමාකිරීමෙන් අනතුරුව ට්‍රෙන්ට්700 එන්ජිම සහිත ඒ330-300 ගුවන් යානා හයක් (06) ද, ට්‍රෙන්ට්XWB එන්ජිම සහිත ඒ350-900 ගුවන් යානා හතරක් (04) ද සෘජුවම එයාර්බස් සමාගමෙන් මිලදී ගැනීමට තීරණයක් ගනු ලැබූ හෙයින් ද;

තවද, 2017දී භාරදීමට නියමිත අමතර ඒ350-900 ගුවන්යානා තුනක් (03) ද, කල්බදු පදනමින් ලබාගැනීමට ද තීරණයක් ගෙන තිබූ හෙයින් ද;

පැරණි ගුවන්යානා වෙනුවට නව ගුවන්යානා යෙදවීමේ කටයුත්ත සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගැනීමේ පදනම මත තීරණයකට එළඹ තිබූ හෙයින් ද;

පසුව, 2020දී, ඒ350-900 ගුවන්යානාවක් භාරදීම සඳහා ඉඩක් වෙන්කරන බව සහතික කරගැනීම සඳහා 2013 මාර්තු 31 වැනි දිනට පෙරාතුව එයාර්බස් සහ රෝල්ස් රොයිස් සමාගම් සමඟින් අවබෝධතා ගිවිසුමකට එළඹීමට ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් කටයුතු කර තිබූ හෙයින් ද;

2013 අප්‍රේල් මාසයේදී භාණ්ඩාගාර ලේකම්, සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී සහ භාණ්ඩාගාරයේ නිලධාරීන් අතර පැවති රැස්වීමකදී රජයේ සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් ශ්‍රීලන්කන් ගුවන් සමාගම, එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපාර සැලසුම් ප්‍රකාරව තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවශ්‍ය වන බව ඉහත කී රැස්වීමේ මුලසුන හෙබවූ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් ප්‍රකාශ කර තිබූ හෙයින් ද;

පසුව, 2013 ජූනි මාසයේදී ඒ350-900 ගුවන් යානයට අදාළ මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ඒ350 ගුවන් යානයක් මිලදී ගැනීම සඳහා එයාර් බස් සමාගම සමඟින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් කටයුතු කර තිබූ හෙයින් ද;

2015න් පසුව එළඹෙන සමයේ ගුවන්යානා අවශ්‍යතාවය සලකා බැලූ ශ්‍රීලන්කන් ගුවන් සමාගම නව ගුවන් ගමන් මාර්ග සැලසුම් කර තවත් ඒ350-900 ගුවන්යානාවක් 2014 සැප්තැම්බර් මාසයේදී ලබාගැනීම සඳහා ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් ගත් තීරණය ද සමඟින් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන්යානා සංචිතයේ ඒ350-900 ගුවන්යානා සංඛ්‍යාව අට (08) දක්වා ඉහළ ගොස් තිබූ හෙයින් ද;

මෙම ගුවන් යානය කල්බදු පදනම මත ලබාගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගුවන් යානා කල්බදු පදනමින් ලබාදෙන සමාගම් වෙත ආරාධනා කර ඒ සම්බන්ධයෙන් තේරීම් ක්‍රියාවලියක් දියත් කළ ශ්‍රීලන්කන් ගුවන් සමාගම මෙම ගුවන් යානය කල්බදු පදනම මත ලබාගැනීම සඳහා අවසානයේදී AetCap නමැති සමාගම තෝරා ගෙන තිබූ හෙයින් ද;

ඒ350-900 වර්ගයේ ගුවන් යානාවලට පැය 17ක් දක්වා කාලයක් එකදිගට පියාසර කිරීමේ හැකියාව ඇති හෙයින් එම ගුවන් යානා වර්ගය ලෝකයේ දීර්ඝතම පියාසර කාල පරාසයක් සහිත ගුවන්යානා වර්ගය වන හෙයින් ද;

ශ්‍රී ලංකාව මෙම ගුවන් යානය මිලදී ගත් මුදල හා ගෙවීමට එකඟව ඇති කල්බදු වාරිකය වෙළෙඳ පොළ වටිනාකමට වඩා සැලකිය යුතු මට්ටමකින් ඉහළ අගයන් වන හෙයින් ද;

මෙම ගුවන් යානා අතරින් කිසිවක් ශ්‍රී ලංකාවට ලාභදායී අන්දමින් මෙහෙයුමෙහි යෙදවීමට නොහැකි බවක් පෙනී ගොස් ඇති හෙයින් ද;

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ එවකට සිටි කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ තීරණ එම ගුවන් සමාගමට මෙන්ම මෙම රටට ද දැවැන්ත අලාභයක් ගෙන දීමට හේතු වූ හෙයින්ද;

පහත සඳහන් කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) එවකට සිටි කළමනාකාරීත්වය රජය විසින් අනුමත කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් සම්පූර්ණයෙන්ම නොසලකා හැර කටයුතු කර තිබේද යන්නත්;

(ආ) පවතින වෙළෙඳ පොළ තත්ත්වයන් සලකා බැලීමේදී, ඉහත සඳහන් කර ඇති පරිදි ගුවන් යානා මිලදී ගැනීම වැරදි විනිශ්චයන් පදනම් කරගෙන ගනු ලැබූ තීරණයක්ද යන්නත්;

(ඇ) එවකට සිටි කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසා ශ්‍රීලන්කන් ගුවන් සමාගමට අලාභයක් සිදුවූයේ ද යන්න සහ, එසේ නම්, ඒ කවර මුදලක්ද යන්න;

(ඈ) එම අලාභ සඳහා කිසියම් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් වගකිවයුත්තන් වන්නේද යන්නත්;

(ඉ) කිසියම් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් හෝ ආයතන මෙම ගනුදෙනු මඟින් කිසියම් අයුතු මුදලක් උපයාගෙන තිබේද යන්න සහ එසේ නම්, ඒ කවුරුන්ද යන්නත්;

(ඊ) රජය විසින් අනුමත කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටින් හිතාමතාම උල්ලංඝනය කිරීමට සහ අයුතු මුදල් ලාභ ලැබීමට වරදකරුවන් වන කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයන්ට විරුද්ධව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න; සහ

(උ) කාරක සභාව විසින් සිය විමර්ශනයන්ට අදාළ යැයි සලකනු ලබන වෙනත් ඕනෑම කාරණයක් පිළිබඳව.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, මෙම කාරක සභාව සාමාජිකයන් විසි එක් දෙනෙකුට (21) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුත්තේ ය.

3. එකී කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) පුද්ගලයන්, ලිපිලේඛන හා වාර්තා කැඳවීමට ද, පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එකී කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස සහ තමන් සන්තකයේ හෝ තම පාලනය යටතේ තිබෙන කිසියම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස කිසියම් පුද්ගලයෙකුට නියම කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා හෝ අදාළ කාර්යය සඳහා නිශ්චිත වශයෙන් බලය පවරන ලද පුද්ගලයකු විසින් සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කොට සත්‍යාක්ෂණය කිරීමට හෝ අන් අයුරකින් විමසා බැලීමට හා දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත සාක්ෂකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට ද;

(ඈ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කලට අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට සහ පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වා ගෙන යෑමට ද;

බලය තිබිය යුත්තේ ය.

4. කාරක සභාව සිය පළමු රැස්වීම් පැවැත්වීමේ සිට මාස හයක් (06) ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙනු ලබන වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත සිය වාර්තාව සකස් කළ යුත්තේය.